# FACTORS INFLUENCING RURAL SCHOOL STUDENTS' DISENGAGEMENT IN ADVANCED LEVEL EXAMINATION

Sachini Silva[1] and Rakshika Rathnayake[2]

**Abstract**

Education is an essential concept for the future existence of students in a country. Education prepares the child to fit into society by improving the child's skills, intelligence, and ability. Here, the school can be introduced as the most essential social utility of a society. However, it will be revealed that even though children have a compulsory education period, they ignore it and drop out of school midway. In the research on Factors Affecting Rural School Students' Abstention in Advanced Level Studies, the research problem of why rural school students is absent from advanced-level studies has been studied. The main objective of the research was to identify the factors that influence rural school students to stay away from studying for the Advanced level examination. And for this, mixed research methods were used for this research. The area that can be identified as rural in Medadumbara Education Division, belonging to Theldeniya Education Zone of Kandy District, is used for the research area. Secondary data is used for this research, and the data obtained from several schools along with Teldeniya Education Zone and previous research reports were used for this research. In this study, it was possible to identify that the economic situation due to the prolonged closure of schools due to the epidemic situation and the loss of interest in going to school influenced the children to drop out of school. As a proposal that can be presented for the situations contained in the conclusion of this research, the streamlining of school management and supervision activities, teaching using technical methods suitable for the new social system, educating adults, educating students about the importance of education, etc.

**Keywords**: Education, Rural school, Advanced level student, Dropping out of the school,

Advanced level.

---

[1] Lecturer, Department of Sociology, University of Kelaniya

Email: sachinin@kln.ac.lk https://orcid.org/0009-0002-5085-0575

[2] Undergraduate, Department of Sociology, University of Kelaniya

Email: rakshikarathnayake@gmail.com https://orcid.org/0009-0008-5162-5605

Accepted the revised version: 01 December 2023. This work is licensed under C BY-SA 4.0. To view a copy of this license, visit http://creativecommons.org/licenses/by- sa/4.0/

## ග්‍රාමීය පාසල් සිසුන් උසස් පෙළ හැදෑරීමෙන් වියුක්ත වීමට බලපාන සාධක


**සාරසංක්ෂේපය**

රටක සිසුන්ගේ අනාගත පැවැත්ම උදෙසා අධ්‍යාපනය අත්‍යවශ්‍ය සංකල්පයකි. අධ්‍යාපනය විසින් ළමයා සතු කුසලතා බුද්ධිය හා හැකියාව දියුණු කරමින් සමාජයට ගැළපෙන පරිදි ළමයා සකස් කරනු ලබයි. මෙහිදී පාසල යනු සමාජයක අත්‍යවශ්‍යම සමාජානුයෝජන කාරකයක් ලෙස හඳුන්වා දිය හැකිය. නමුත් ළමුන්ගේ අනිවාර්ය අධ්‍යාපන කාල සීමාවක් ද තිබුණ ද, එය නොසලකා හැර අතරමඟ පාසල් හැර යාම සිදු වන බව අනාවරණය වනු ඇත. ග්‍රාමීය පාසල් සිසුන් උසස් පෙළ හැදෑරීමෙන් වියුක්ත වීමට බලපෑම් කරන සාධක යන පර්යේෂණයේ ග්‍රාමීය පාසල් සිසුන් උසස් පෙළ හැදෑරීමෙන් වියුක්ත වන්නේ ඇයි? යන පර්යේෂණ ගැටලුව අධ්‍යනය කර ඇත. ප්‍රධාන වශයෙන්ම පර්යේෂණ පරමාර්ථය කොට ගැනුනේ, ග්‍රාමීය පාසල් සිසුන් අ.පො.ස උසස් පෙළ විභාගය හැදෑරීමෙන් වියුක්ත වීමට බලපෑම් කරන සාධක හඳුනා ගැනීම වන අතර මේ සඳහා මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය යොදා ගනු ලැබීය. මේ සඳහා මැදදුම්බර අධ්‍යාපන කලාපයේ ග්‍රාමීය වශයෙන් හඳුනා ගත හැකි ප්‍රදේශ පර්යේෂණ ක්ෂේත්‍රය වශයෙන් යොදා ගෙන තිබේ. මෙම පර්යේෂණය සඳහා ද්විතියික දත්ත යොදා ගත් අතර තෙල්දෙණිය අධ්‍යාපන කලාපය සමඟ පාසල් කිහිපයකින් ලබා ගත් දත්ත සහ පූර්ව පර්යේෂණ වාර්තා භාවිත කර ඇත. ආර්ථික තත්ත්වය, වසංගත තත්ත්වය හමුවේ දීර්ඝ කාලයක් පාසල් වසා තැබීම නිසා පාසල් යාමට ඇති උනන්දුව නැති වී යාම දරුවන් පාසල් හැර යාමට බලපෑම් කළ බව මෙම අධ්‍යයනයේදී හඳුනා ගැනීමට හැකියාව ලැබුණි. එහිදි දරුවා ජීවත් වන කුඩාම ඒකකයේ සිට එනම් පවුලේ සිට සමාජය දක්වා ලැබෙන අත්දැකීම් හා පසුබිම ඒ සඳහා විශේෂිත බලපෑමක් සිදු කරන බව පැහැදිලි විය. දැනුම, ආකල්ප, කුසලතා වලින් පිරිපුන් පුද්ගලයෙකු බිහි කිරීමේ කාර්යභාරය එයට පැවරී ඇත්තේ සමාජයටය. මෙහිදි සංස්කෘතියට අදාලව ජාතික අරමුණු ඔස්සේ ක්‍රියාත්මක වෙමින් පාසල මෙම වගකීම ඉටු කිරීමට ක්‍රියා කරනු ලබයි. මේ සියලු තත්ත්වයන් පදනම් කරගනිමින් දරුවෙකු පාසල් යාම ඉතාම අත්‍යවශ්‍ය දෙයක් බවට පත්ව තිබේ. මෙම පර්යේෂණයේ නිගමනයන් තුළ අන්තර්ගත වූ තත්ත්වයන් සඳහා ඉදිරිපත් කළ හැකි යෝජනාවන් ලෙස, පාසල් කළමනාකරණය හා අධීක්ෂණ කටයුතු විධිමත් කිරීම. නව සමාජ ක්‍රමයට ගැලපෙන තාක්ෂණික ක්‍රමයන් භාවිතයෙන් ඉගැන්වීම, වැඩිහිටියන් දැනුවත් කිරීම, අධ්‍යාපනයේ පවතින වැදගත්කම පිලිබඳව සිසුන් දැනුවත් කිරීම ආදිය දැක්විය හැකිය.


**ප්‍රමුඛ පදඃ** අධ්‍යාපනය, උසස් පෙළ ග්‍රාමීය පාසල, උසස් පෙළ සිසුන්, පාසල් හැර යාම

### හැදින්වීම

පවතින කවර සමාජ ක්‍රමයක වුවද මිනිසාට දැනුමෙන් තොරව ජීවත් විය නොහැකිය. නව ලෝකයත් සමඟ ඉදිරියට යන්නට නම් කවර සමාජයක වුව ද ජනතාව දැනුමෙන් පරිපූර්ණ විය යුතු වේ. මිනිසෙකුගේ අධ්‍යාපන ක්‍රියාවලිය, දරුවෙකු මෙලොව එළිය දුටු දා සිට ජීවිතය අවසානය දක්වාම ක්‍රියාත්මක වනු දක්නට ලැබේ. මහින්දාගමනයත් සමඟ ලාංකීය සමාජය තුළ ඇති වූ බෞද්ධ සංස්කෘතියත් සමඟ මෙරට බෞද්ධ අධ්‍යාපන ක්‍රමය ඇති වූ අතර අතීතයේ ගුරු ගෙදරින් ආරම්භ වී පන්සල, පිරිවෙන ඔස්සේ දියුණු වූ දේශීය අධ්‍යාපන ක්‍රමය, විදේශීය ආක්‍රමණයන්ගෙන් බිහි වු යටත් විජිත සමයේ දී විවිධ වෙනස්වීම් වලට භාජනය විය. ලාංකීය අධ්‍යාපන පද්ධතිය ගත් විට දීර්ඝ ඉතිහාසයක් ඇති අතරම, අධ්‍යාපන පද්ධතියේ ආරම්භය, වර්ධනය හා විකාසය යුග කිහිපයක් ඔස්සේ පහත පරිදි හඳුනා ගත හැකිය.

- යටත් විජිත යුගයට පෙර යුගය
- පෘතුගීසි යුගය
- ලන්දේසි යුගය
- ඉංග්‍රීසි යුගය
- නිදහසින් පසු යුගය (වන්නිආරච්චි, 2004. පි. 18).

අධ්‍යාපන ක්ෂේත්‍රයේ සුවිශේෂීම සිදුවීමක් වන්නේ 1945.10.01 වන දින දී ආචාර්ය සී.ඩබ්.ඩබ් කන්නන්ගර මහතා විසින් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ඇතුළත් ප්‍රකාශනයක් එවකට රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඉදිරිපත් කර එය සම්මත කර ගැනීමයි. වර්තමානයේ පවතින නිදහස් අධ්‍යාපන ක්‍රමවේදයේ ආරම්භ වීම මෙම ප්‍රතිසංස්කරණයේ ප්‍රමුඛ ප්‍රතිඵලයකි. එයට අමතරව ප්‍රාථමික පාඨශාලාවේ ඉගැන්වීම් මාධ්‍ය මව් භාෂාව කිරීම, ඉංග්‍රීසි දෙවන භාෂාවක් ලෙස අනිවාර්ය කිරීම, ග්‍රාමීය අධ්‍යාපනය දියුණු කිරීම, ගුරු විද්‍යාල ආරම්භ කිරීම, ලංකා විශ්ව විද්‍යාලය මගින් උපාධිධාරී ගුරුවරුන් පුහුණු කිරීම, ගුරුවරුන්ට මාසික වැටුපක් ලබාදීම, පාසල් යෑම අනිවාර්යය

කිරීම, අධ්‍යාපන පර්යේෂණ මණ්ඩලයක් ඇති කිරීම, මධ්‍ය මහා විද්‍යාල ඇති කිරීම, වැඩිහිටි අධ්‍යාපනය ආරම්භ කිරීම, පාසල් හැර යන සිසුන්ට කර්මාන්ත පුහුණුවක් ලබා දීම, පාසලේ වැඩ ගම්වැසියන්ගේ රැකියා වලට සම්බන්ධ කිරීම, අධ්‍යාපන උපයෝගී සේවා ඇති කිරීම, ළමයින්ට දිවා ආහාරය ලබා දීම, දුප්පත් දක්ෂ ළමුන්ට අධ්‍යාපන ශිෂ්‍යත්ව ලබාදීම, මූලික අධ්‍යාපන ශිෂ්‍යත්ව ලබාදීම, මූලික අධ්‍යාපන අවස්ථා වැඩි කිරීම යන යෝජනා ද එම ප්‍රතිසංස්කරණයේ ඇතුළත් වී තිබුනි.

මෙලෙස ආරම්භ වූ ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමවේදය වර්තමානය වන විට අධි තරගකාරී මුහුණුවරක් ගෙන තිබේ. එමෙන්ම බොහෝ පුරවැසියන් අධ්‍යාපනය තම මූලික අවශ්‍යතාවයක් ලෙස හඳුනාගෙන තිබේ. ඒ අනුව 1947 වර්ෂය වන විට 58.04% ව පැවති මෙරට සාක්ෂරතාවය 2014 වර්ෂය වන විට 92.5% දක්වා වර්ධනය වී තිබේ. එමෙන්ම එම වසර වන විට මෙරටේ කාන්තා සාක්ෂරතාවය 93.05% ක් ද, පුරුෂ සාක්ෂරතාවය 91.6% ක් ද, වන ඉහළ අගයක රැඳී තිබුනි. එමෙන්ම අවුරුදු 5-14 වයසේ සිටින සිසුන්ගේ ශුද්ධ ඇතුළත් වීමේ අනුපාතය 2012 වර්ෂය වන විට 98.4% ක් වූ අතර එය 2013 වර්ෂය වන විට 98.8% දක්වා ක්‍රමිකව වර්ධනය වී තිබේ (සංඛ්‍යාලේඛන නිබන්ධනය අධ්‍යාපන, 2016).

මෙලෙස පරපුරෙන් පරපුරට දැනුම සම්ප්‍රේෂණය කිරීමේ ප්‍රධානතම මාධ්‍යය ලෙස පිළිගැනෙන්නේ අධ්‍යාපනයයි. එසේ පවතින දැනුම බෙදා දීමටත්, නව දැනුම ගොඩ නැගීමටත් ඉවහල් වන ප්‍රධානතම මාධ්‍ය ලෙස පාසල හඳුන්වා දිය හැකිය. අධ්‍යාපනය ලබා දෙන ප්‍රධානම ආයතනය වන්නේ පාසල වන බැවින් පාසල කෙරෙහි සියලු දෙනා පූර්ණ විශ්වාසය තබා ඇත.

අධ්‍යාපන පද්ධතිය තුළ අද වන විට සිදු වී තිබෙන දීර්ඝ වෙනසත්, දියුණුවත් දෙස බැලීමේදී අධ්‍යාපනය යන්න මිනිසාට පැහැදිලි වටිනාකමක් එකතු කරන අංශයක් ලෙස හඳුනාගත හැකි වේ. මෙහිදී පවතින දැනුම බෙදා දීමටත් නව දැනුම් ලබා ගැනීමටත්, උපකාරී වන ආයතනයක් ලෙස පාසලට ප්‍රමුඛත්වයක් හිමි වී තිබේ. අධ්‍යාපනය යනු පුද්ගලයකුගේ ශාරීරික හා චිත්තවේගීය හැසිරීම් ධනාත්මකව වර්ධනය කරන ක්‍රියාවලියකි. අධ්‍යාපනයේ දාර්ශනික අර්ථ දැක්වීම් වලින් එකක් වන්නේ දැනුම, කුසලතා, සාරධර්ම සහ සමාජ ආචාර ධර්ම එක් පරම්පරාවක සිට ඊළඟ පරම්පරාවට සම්ප්‍රේෂණය කිරීමයි. අධ්‍යාපනය වනාහි "හුදෙක් දැනුම අත්කර ගැනීමක් නොව ජීවිතය සමස්තයක් කොට ගෙන ඊට අදාළ සියලු දෙයට මුහුණ දිය හැකි සමෝධාන පුද්ගලයකු බිහි කිරීම" බව යන්න ක්‍රිෂ්ණ මූර්තිතුමා විසින් "Education and The Significance of Life" නම් ග්‍රන්ථයේ විග්‍රහ කොට ඇත (කාරියවසම්, 1999. පි. 65). මෙලෙසින් පැහැදිලි වන්නේ අධ්‍යාපනය වනාහි පුද්ගලයෙකුගේ ජීවිතය දැනුමින් පමණක් පෝෂණය කරන්නා වූ අංශයක් නොව, එහිදී පුද්ගලයකුට සමාජයේ සෑම පැතිකඩක් පිළිබඳවම පුළුල් දැනුමක් ලබාගත හැකි ඉතාමත් වැදගත් අංශයක් බවයි. හින්දි භාෂාවෙන් "Siksha" යන වචනයේ නිරුක්තිය විග්‍රහ කරමින් අධ්‍යාපනය යනු මඟ පෙන්වීමේ ක්‍රියාවලියක් බව විග්‍රහ කොට ඇත (සේනාධීර, 2002. පි. 53). මෙලෙසින් පැහැදිලි වන්නේ අධ්‍යාපනය තුළ පවතින වටිනාකමයි. එලෙසින්ම අධ්‍යාපනය මිනිසාගේ ජීවිතයේ මඟ පෙන්වීමක් සිදු කරන වැදගත් අංශයක් ලෙස දැක්විය හැකිය. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාකාරී මට්ටමේ පවතින සමස්ත පාසල් සංඛ්‍යාව 2014 වන විට 10,123 වූ අතර එයින් 3% ජාතික පාසල් ද, 97% පළාත් සභා පාසල් ද, විය. එමෙන්ම එම වසර වන විට ශ්‍රී ලංකාවේ පිහිටා තිබූ පිරිවෙන් සංඛ්‍යාව 747 කි (සංඛ්‍යා ලේඛන නිබන්ධනය අධ්‍යාපන, 2016).

මෙලෙස ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය පුළුල් වශයෙන් අද වන විට දියුණු වී පැවතුනත්, අධ්‍යාපනය මිනිසාව ඉහළට ඔසවා තබන සාධකයක් වුවත්, විවිධාකාර සාධක හේතුවෙන් සිසුන් පාසල් පැමිණීමෙන් වැළකී සිටීමේ ප්‍රවනතාවයක් දක්නට ලැබෙන බව කිව හැකිය. විශේෂයෙන්ම ග්‍රාමීය පාසල්වල සිසුන් පාසල් හැර යාමේ ගැටලුව දැකගත හැකිය. මූලික අධ්‍යාපනය ලැබීම සෑම ළමයෙකුටම අනිවාර්යය වේ. ළමයා යන්න කවුරුන් ද? යන්න නිර්වචනය කරන, 1998 අංක 55 දරණ ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිළිබඳ පනතේ 39 වගන්තියට අනුව ළමයා යනු වයස අවුරුදු 18ට ට අඩු තැනැත්තෙක් බව දැක්වේ (ගුණසේකර, 2006. පි. 35). පාසල් යා යුතු වයස අවුරුදු 5-17 අතර වයස වුව ද ශ්‍රී ලංකාවේ විවිධ හේතූන් මත පාසල් අධ්‍යාපනය හැර යන පාසල් ළමුන් සිටින බව පර්යේෂණ මගින් අනාවරණය වී තිබේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 1948.12.10 දින සම්මත කරන ලද මානව අයිතිවාසිකම් සම්මුතියේ 26 වන වගන්තියේ සියලු දෙනා හට ලැබිය යුතු අයිතිවාසිකමක් ලෙස අධ්‍යාපනය දක්වා ඇත. තවද 1989.11.20 දින එක්සත් ජාතීන්ගේ සංවිධානය ළමා පරපුර මිනිස් සංහතියේ විශේෂ ගණයක් ලෙස සළකා, ළමුන් සතු අයිතිවාසිකම් වෙනම ලේඛන ගත කළ අතර එය ළමා අයිතිවාසිකම් සම්මුතිය නම් වේ. එහි 28 හා 29 දරණ වගන්ති මගින් ළමුන් භුක්ති විඳිය යුතු අයිතිවාසිකමක් ලෙස අධ්‍යාපනය දක්වා ඇත. එය මෙසේය "සෑම ළමයෙකුටම අධ්‍යාපනය ලැබීමේ අයිතිය ඇත. මෙම අයිතිය භුක්ති විඳීම සහතික කරනු සඳහා රාජ්‍යයෙන් ප්‍රාතමික අධ්‍යාපනය අනිවාර්‍ය කළ යුතු අතර නොමිලේ සැපයිය යුතුය. පාසල් අධ්‍යාපනය ලැබීම සඳහා දිරි ගැන්වීමට සහ අතරමග පාසල් හැර යාම වැළැක්වීමට පියවර ගත යුතුය" (වන්නිආරච්චි, 2004. පි. 12). ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ 185 වන අධිකාරිය වූ

අධ්‍යාපන ආඥා පනතේ 37 වන වගන්තිය යටතේ අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග යටතේ මෙසේ දක්වා ඇත.

01. මෙම නියෝග 2015 අංක 1 දරණ ළමයින් අනිවාර්යයෙන් පාසල් වලට පැමිණීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. මෙහිදී මින්මතු "අනිවාර්ය අධ්‍යාපන වයස" යනුවෙන් හඳුන්වනු ලබන වයස අවුරුදු 5 ට නොඅඩු සහ අවුරුදු 16 කට නොවැඩි සෑම ළමයෙකුගේම දෙමව්පියන් විසින්, ඒ ළමයාගේ අධ්‍යාපනය සඳහා වෙනත් අයුරකින් ප්‍රමාණවත් හා සුදුසු විධිවිධාන සලස්වා ඇත්නම් මිස, නිතිපතා පාසලට පැමිණ අධ්‍යාපනයක් ලැබීමට ඒ ළමයාට කටයුතු සලස්වා දිය යුතුය. (අනිවාර්ය අධ්‍යාපන ගැසට් නිවේදනය, 2016).

මෙලෙස අධ්‍යාපන අමාත්‍යංශයේ ගැසට් පත්‍ර මඟින් ද, පාසල් යා යුතු වයසේ ලමුන් පාසල් යැවීම අනිවාර්ය කොට තිබේ. එමෙන්ම අ:පොඃස සාමාන්‍ය පෙළ විභාගයෙන් අනතුරුව ද, සිසුන් බොහෝ ප්‍රමාණයක් පාසල් අධ්‍යාපනය අතරමග නවතා දමනු දක්නට ලැබේ. අද පවතින අධ්‍යාපන තත්වයත් සමග සාමාන්‍ය පෙළ, උසස් පෙළ පමණක් නොව උපාධිය දක්වාම ඉගෙන ගැනීම අතිශය වැදගත් කාරණාවක් වී ඇත්තේ අද වන විට සුළු රැකියාවන් සඳහා ද, විශාල අධ්‍යාපන සුදුසුකම් ප්‍රමාණයක් අවශ්‍යව ඇති බැවිනි. කෙසේ වෙතත් මෙසේ පවතින වාතාවරණයක වුව ද අද වන විටත් විශේෂයෙන්ම ග්‍රාමීය පාසල් සිසුන් අ:පොඃස සාමාන්‍ය පෙළ විභාගයෙන් පසුව තම අධ්‍යාපනය අතරමඟ නවතා දමනු දක්නට ලැබේ.

පාසල් යා යුතු වයස අවුරුදු 5-17ත් අතර දරුවන් 452,661ක් පාසල් නොයන බවත් ඉන් දරුවන් 51,249ක් කිසිදා පාසලකට ගොස් නැති බවත් රජයේ පාර්ශව කිහිපයක් එක්ව සිදු කළ සමීක්ෂණයකින් අනාවරණය වී ඇත. මෙය කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍යාංශයේ ඉල්ලීමකට අනුව ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය නිකුත් කළ "ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණය - 2016" වාර්තාවෙන් මේ බව අනාවරණය වෙයි. එම සමීක්ෂණය සමස්ත දිවයිනම ආවරණය වන පරිදි 2016 වර්ෂයේ දී සිදු කර ඇත. එම සමීක්ෂණය සඳහා දරුවන්ගේ ප්‍රජා විද්‍යාත්මක තොරතුරු, පාසල් අධ්‍යාපනය, ආර්ථික ක්‍රියාකාරකම්, සෞඛ්‍ය හා සුරක්ෂිතතාව, දෙමාපියන්ගෙන් ලබාගත් තොරතුරු හා විවිධ රැකියාවන්හි හා ශ්‍රම සැපයීම්වල යෙදී සිටින දරුවන්ගේ තොරතුරු ලබාගෙන ඇත. එම සමීක්ෂණ වාර්තාවේ දැක්වෙන්නේ මෙරට ජනගහනයෙන් 4.6%ක් හෙවත් 4,571,442 ක් වයස අවුරුදු 5-17ත් අතර වයසේ පසුවන බවයි. ඉන් පාසල් යන්නේ 90.1% ක් හෙවත් ළමුන් 4,118,741කි. 9.9% ක් හෙවත් 452,661ක් පාසල් නොයයි. ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණ වාර්තාවට අනුව ඉන් දරුවන් 51,249ක් හෙවත් සමස්ත අදාල වයස් කාණ්ඩයෙන් 1.12% ක් කිසි දිනක පාසල් ගොස් නැත. සමීක්ෂණ වාර්තාවට අනුව කිසි දිනක පාසල් නොගිය ළමුන්ගෙන් වැඩි පිරිසක් ග්‍රාමීයව ජීවත්වන දෙමාපියන්ගේ දරුවන්ය. එය සංඛ්‍යාත්මකව 40394 ක්. එනම් කිසිදා පාසල් නොගිය ළමුන්ගෙන් 78.82%ක් ජීවත් වන්නේ ග්‍රාමීය පරිසරයේය. ඉන් 2329ක් වතු හෙවත් කිසිදා පාසල් නොගිය දරුවන්ගෙන් 4.54% ක් වතු ආශ්‍රිතව ජීවත්වන දෙමාපියන්ගේ දරුවන් බව ද සමීක්ෂණ වාර්තාවේ දැක්වේ. නාගරිකව ජීවත්වන දරුවන් 10,885ක් කිසිදා පාසල් ගොස් නොමැති අතර එය 21.18% ක් වේ. සමීක්ෂණ වාර්තාව අනුව කිසිදා පාසල් නොයන දරුවන්ගෙන් 44,619ක් වයස අවුරුදු 5-11ත් අතර සීමාවේ පසුවන අතර වයස අවුරුදු 12-14 අතර සීමාවේ පසුවන දරුවන් සංඛ්‍යාව 3395ක් වේ. වයස අවුරුදු 15-17ත් අතර කිසිදා පාසල් නොගිය දරුවන් සංඛ්‍යාව 3225ක් බව ද එම වාර්තාවේ දැක්වේ. එනම් කිසිදා පාසල් නොගිය දරුවන්ගෙන් 87.07%ක් පසුවන්නේ වයස අවුරුදු 5-11ත් අතර 6.63%ක් වයස අවුරුදු 12-14ත් අතර වයස් කාණ්ඩයට ගැනෙන අතර 6.3%ක් වයස අවුරුදු 15-17ත් අතර වයස් කාණ්ඩයට අයත් වන බව පැහැදිලි වේ (ළමා ක්‍රියාකාරකම් සමීක්ෂණය, 2016). සමීක්ෂණ වාර්තාවට අනුව වතු පේලි නිවාස ආශ්‍රිතව, නාගරික මුඩුක්කු ආශ්‍රිතව හා දීර්ඝ කාලීන යුද්ධයකට මුහුණ දුන් පළාත් වල දෙමාපියන් තම දරුවන්ට අධ්‍යාපනය ලබාදීමේ උනන්දුව සාපේක්ෂව අඩු අගයක පවතින බව පෙනෙන්නට තිබේ. එමෙන්ම පවුල් සංස්ථාව බිඳ වැටීම හේතුවෙන් දරුවන් කෙරෙහි අවදානය අඩුවීම, මව විදේශගත වීම, පියා විදේශගත වීම හෝ පවුල හැරයාම, මව පියා වෙනත් විවාහයන්ට යොමු වීම, දරුවන් නිවාසගත වීම, විවිධ අපරාධ හා අපචාරයන්ට දරුවන් යොමු වීම, දරිද්‍රතාව හේතුවෙන් රැකියා සඳහා යොමු වීම, දෙමාපියන්ගේ නූගත්කම, පාරිසරික සාධක ආදී බොහෝ කරුණු දරුවන් අතරමග පාසල් හැරයාම කෙරෙහි බලපාන බව ද, සමාජ විශ්ලේෂකයෝ පෙන්වාදෙති.

කෙසේ වුව ද ඉහත සඳහන් කළ සමීක්ෂණ අනුව ග්‍රාමීය පාසල් සිසුන් බොහෝමයක් අතරමඟදී පාසල හැර යන බව අනාවරණය වී ඇත. මෙලෙස ග්‍රාමීය පාසල් සිසුන් අ:පොඃස සාමාන්‍ය පෙළින් අනතුරුව පාසල් අත හැර යාම සඳහා බලපෑම් කරන සාධක කෙරේ අවධානය යොමු කරමින් මෙම පර්යේෂණය සිදු කර තිබේ.

***පර්යේෂණ ගැටලුව***

පර්යේෂණ ගැටලුව ලෙස "ග්‍රාමීය පාසල් සිසුන් උසස් පෙළ හැදෑරීමෙන් වියුක්ත වන්නේ ඇයි?" යන්න පිලිබඳව අධ්‍යයනය කර තිබේ. අධ්‍යාපනය ලැබීමට දරුවෙකුට ඇති අයිතිය ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව මගින් ද තහවුරු කළ මූලික අයිතිවාසිකමක් ව තිබියදීත් බොහෝ සිසුන් ප්‍රමාණයක් අතර මඟදී පාසල් හැර යාම අතිශය ගැටලුකාරී තත්ත්වයක් බව කිව යුතුය. සිසුන් පාසල් හැර යාම සම්බන්ධයෙන් හේතු වන්නා වූ සාධක විවිධ පර්යේෂණ මගින් අනාවරණය කරගෙන ඇති අතර එහිදී විශාල වශයෙන් නාගරික, වතු සහ ග්‍රාමීය පාසල් සිසුන් පාසල් අධ්‍යාපනයෙන් වියුක්ත වී ඇත. සමාජයක පැවැත්ම සම්බන්ධයෙන් බුද්ධිමත් ජනතාවක් සිටීම අතිශය වැදගත් කාරණාවක් වේ. විශේෂයෙන්ම අද වන විට අ:පො:ස සාමාන්‍ය පෙළ විභාගයෙන් අනතුරුව සිසුන් පාසල් අධ්‍යාපනය අතහැර යන ආකාරය සමාජය දෙස බැලීමේදී පසක් වන අතර එය සමාජ පරිහානියට තුඩු දෙන ගැටලුවක් ලෙස ද දැක්විය හැකිය. අද වන විට බොහෝ රැකියාවන් සඳහා අවම වශයෙන් අ:පො:ස උසස් පෙළ විභාගයවත් සමත් වී තිබීම මූලික සුදුසුකමක් වශයෙන් සැලකීම නිසා සිසුන් අ:පො:ස සාමාන්‍ය පෙළ විභාගයෙන් අනතුරුව පාසල් හැර යාම සිසුන්ට බලපෑම් කරන සාධකයක් බවට පත්ව ඇත. මේ අනුව පර්යේෂණ ගැටලුව ලෙස "ග්‍රාමීය පාසල් සිසුන් උසස් පෙළ හැදෑරීමෙන් වියුක්ත වන්නේ ඇයි?" යන්න පිලිබඳව අධ්‍යයනය කර තිබේ.

***පරමාර්ථය***

ග්‍රාමීය පාසල් සිසුන් අ:පො:ස උසස් පෙළ විභාගය හැදෑරීමෙන් වියුක්ත වීමට බලපෑම් කරන සාධක හඳුනා ගැනීම.

***සෙසු අරමුණු***

i. ග්‍රාමීය පාසල් සිසුන් අ:පො:ස උසස් පෙළ විභාගය හැදෑරීමෙන් වියුක්ත වීමට බලපෑම් කරන නව ගැටලුකාරි සාධක හඳුනා ගැනීම.
ii. ග්‍රාමීය පාසල් සිසුන් අ:පො:ස උසස් පෙළ විභාගය හැදෑරීම සඳහා යොමු වීමට පෙර පාසල් හැර යාමේ ප්‍රවනතාවය හඳුනා ගැනීම.
iii. ග්‍රාමීය පාසල් සිසුන් අ:පො:ස උසස් පෙළ විභාගය හැදෑරීමෙන් වියුක්ත වීමට බලපාන හේතු සඳහා විසඳුම් යෝජනා කිරීම.

**පර්යේෂණ ක්‍රමවේදය**

ග්‍රාමීය පාසල් සිසුන් උසස් පෙළ හැදෑරීමෙන් වියුක්ත වීමට බලපෑම් කරන සාධක යන පර්යේෂණයේ ග්‍රාමීය පාසල් සිසුන් උසස් පෙළ හැදෑරීමෙන් වියුක්ත වන්නේ ඇයි? යන පර්යේෂණ ගැටලුව අධ්‍යයනය කිරීමේදී මෙම පර්යේෂණය සඳහා මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය භාවිතා කර තිබේ. මේ සඳහා ප්‍රධාන වශයෙන්ම ද්විතියික දත්ත භාවිත කර තිබේ.

අධ්‍යයනය කරනු ලැබුවේ ග්‍රාමීය පාසල් සිසුන් උසස් පෙළ හැදෑරීමෙන් වියුක්ත වීමට බලපාන්නා වූ හේතු සාධක වන බැවින් මහනුවර දිස්ත්‍රික්කයේ තෙල්දෙණිය අධ්‍යාපන කලාපය තුළ පිහිටි මැදදුම්බර අධ්‍යාපන කොට්ඨාසයේ ග්‍රාමීය වශයෙන් හඳුනා ගත හැකි ප්‍රදේශ පර්යේෂණ ක්ෂේත්‍රය වශයෙන් යොදා ගෙන තිබේ. තෙල්දෙණිය අධ්‍යාපන කලාපය මගින්ද, තෙල්දෙණිය අධ්‍යාපන කලාපයේ පාසල් කිහිපයකින් ලබා ගත් දත්ත සහ පූර්ව පර්යේෂණ වාර්තා මෙම පර්යේෂණය සඳහා භාවිතා කර තිබේ. මෙහිදී මෙම පර්යේෂණය සඳහා ප්‍රධාන වශයෙන්ම අරමුණුගත නියැදීමේ ක්‍රමය භාවිත කර තිබේ. මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය යටතේ ප්‍රමාණාත්මක දත්ත සහ ගුණාත්මක දත්ත යන දත්ත දෙවර්ගයම මෙම පර්යේෂණය සඳහා භාවිතයට ගෙන තිබේ. වාර්ෂිකව සිසුන්ගේ පාසල් හැර යාමේ ප්‍රතිශතය ද, එමෙන්ම ඒ ඔස්සේ පාසල් වල විෂය ධාරාව අනුව සිසුන්ගේ පාසල් හැර යාමේ ප්‍රතිශතය, විදුහල් වශයෙන් සිසුන්ගේ පාසල් හැර යාමෙහි ප්‍රවනතාවය ආදිය ප්‍රමාණාත්මක දත්ත මගින් විශ්ලේෂණය කිරීමට හැකියාව ලැබුණි. එමෙන්ම සිසුන්ගේ පාසල් හැර යාමට බලපෑම් කරන්නා වූ ආර්ථික, සංස්කෘතිකික, සමාජීය සාධක ආදිය පිලිබඳව ගුණාත්මක දත්ත මගින් විශ්ලේෂණය කොට තිබේ. මිශ්‍ර පර්යේෂණ ක්‍රමවේදය යටතේ ප්‍රමාණාත්මක දත්ත සහ ගුණාත්මක දත්ත යන දත්ත දෙවර්ගයම මෙම පර්යේෂණය සඳහා භාවිතයට ගෙන තිබේ. වාර්ෂිකව සිසුන්ගේ පාසල් හැර යාමේ ප්‍රතිශතය ද, එමෙන්ම ඒ ඔස්සේ පාසල් වල විෂය ධාරාව අනුව සිසුන්ගේ පාසල් හැර යාමේ ප්‍රතිශතය, විදුහල් වශයෙන් සිසුන්ගේ පාසල් හැර යාමෙහි ප්‍රවනතාවය ආදිය ප්‍රමානාත්මක දත්ත මගින් විශ්ලේෂණය කිරීමට හැකියාව ලැබුණි. එමෙන්ම සිසුන්ගේ පාසල් හැර යාමට බලපෑම් කරන්නා වූ ආර්ථික, සංස්කෘතිකික, සමාජීය සාධක ආදිය පිලිබඳව ගුණාත්මක දත්ත මගින් විශ්ලේෂණය කොට තිබේ. මෙම පර්යේෂණ පත්‍රිකාව තුළදී ගුණාත්මකව ලබා ගන්නා ලද දත්ත කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර තිබෙන අතර ප්‍රමානාත්මක දත්ත

ද මේ සඳහා යම් තාක් දුරකට යොදා ගනිමින් විශ්ලේෂණය කිරීම මගින් පර්යේෂණයේ අරමුණු වඩාත් සාර්ථක අන්දමින් සඵල කර ගැනීමට උපකාරි විය.

**ග්‍රාමීය පාසල් උසස් පෙළ සිසුන් පාසල් අධ්‍යාපනයෙන් වියුක්ත වීමට බලපෑම් කරන සාධක**

ග්‍රාමීය පාසල් සිසුන් උසස් පෙළ හැදෑරීමෙන් වියුක්ත වීමට බලපෑම් කරනු ලබන සාධක පිලිබඳව විමසා බැලීමේදී මැදදුම්බර අධ්‍යාපන කොට්ඨාසය තුළ උසස් පෙළ සහිත පාසල් 12ක් හඳුනා ගත හැකිය. මැදදුම්බර අධ්‍යාපන කොට්ඨාසය තුළ සිසුන් පාසල් නොපැමිණීම නිසා දුනුවිල මහාබෝධි මහා විද්‍යාලයේ උසස් පෙළ පන්ති ඉවත් කර තිබෙන බව ක්ෂේත්‍ර දත්ත මගින් හඳුනා ගැනීමට හැකියාව ලැබුනි. එමෙන්ම මැදදුම්බර අධ්‍යාපන කොට්ඨාසය තුළ පවතින පාසල් 12න් ඇතැම් පාසල් වල පවතින්නේ කලා විෂය ධාරාව පමණක් හෝ කලා සහ වාණිජ යන විෂය ධාරා 2ක පමණි. එවැනි පාසල් 10ක් හඳුනා ගැනීමට හැකියාව ලැබුනි. මෙයින් කලා, විද්‍යා හා වාණිජ යන විෂය ධාරා 3ම සහිත පාසල් 2ක් ද හඳුනා ගැනීමට හැකියාව ලැබුනි. මේ අනුව 1AB පාසල් 2ක්ද, 1C පාසල් 4ක්ද සහ 1C ද්විතියික පාසල් 5ක්ද වශයෙන් හඳුනා ගැනීමට හැකියාව ලැබුනි. පාසල් අතුරින් ග්‍රාමීය වශයෙන් පවතින පාසල් 8ක් හඳුනා ගැනීමට හැකියාව ලැබුනි. එනම් 66.66% ක ප්‍රතිශතයකි. මෙම ග්‍රාමීය පාසල් 8හි 2019ත් 2023ත් අතර කාල පරාසය තුළ පාසල් හැර ගිය මුළු සිසුන් ප්‍රමාණය 192 ක් ද වශයෙන් ක්ෂේත්‍ර දත්ත තුළින් හඳුනා ගැනීමට හැකියාව ලැබුනි. පාසල් වශයෙන් උසස් පෙළ හැර ගිය සිසුන් සංඛ්‍යාව සහ එය ප්‍රතිශතාත්මක වශයෙන් පහත වගුවෙහි සඳහන් වේ.

**වගු අංක 1**


***තෙල්දෙණිය අධ්‍යාපන කලාපය තුළ උසස් පෙළ සහිත ග්‍රාමීය පාසල් වල 2019ත් 2023ත් අතර පාසල් හැර ගිය උසස් පෙළ සිසුන් සංඛ්‍යාව.***

| පාසල | උසස් පෙළ හැර ගිය සිසුන් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| දුන්හින්න ද්විතියික පාසල | 28 | 14 .58% |
| උඩිස්පත්තුව ද්විතියික පාසල | 22 | 11 .46% |
| මැදමහනුවර ද්විතියික පාසල | 30 | 15 .63% |
| රංගල දෙමළ මහා විද්‍යාලය | 35 | 18 .23% |
| දුනුවිල මහාබෝධි මහා විද්‍යාලය | 15 | 7 .81% |
| සෙනරත්වෙල මහා විද්‍යාලය | 13 | 6 .77% |
| මාබේරියතැන්න දෙමළ මහා විද්‍යාලය | 24 | 12 .05% |

**මූලාශ්‍රයඃ තෙල්දෙණිය අධ්‍යාපන කලාප දත්ත : 2023**

**ප්‍රස්තාර අංක 1**

***තෙල්දෙණිය අධ්‍යාපන කලාපය තුළ උසස් පෙළ සහිත ග්‍රාමීය පාසල් වල 2019ත් 2023ත් අතර පාසල් හැර ගිය උසස් පෙළ සිසුන් සංඛ්‍යාව.***




මූලාශ්‍රය: තෙල්දෙණිය අධ්‍යාපන කලාප දත්ත : 2023

**වගු අංක 2:**

***තෙල්දෙණිය අධ්‍යාපන කලාපය තුළ කලා, වාණිජ සහ විද්‍යා විෂය ධාරාවන්හි පාසල් හැර ගිය සිසුන් සංඛ්‍යාව***


| පාසල | කලා | වාණිජ | විද්‍යා |
|---|---|---|---|
| දුන්හින්න ද්විතියික පාසල | 15 | 8 | 5 |
| උඩිස්පත්තුව ද්විතියික පාසල | 13 | 9 | |
| මැදමහනුවර ද්විතියික පාසල | 18 | 12 | |
| රංගල දෙමළ මහා විද්‍යාලය | 26 | 9 | |
| වරදිවෙල මහා විද්‍යාලය | 10 | 15 | |
| දුනුවිල මහාබෝධි මහා විද්‍යාලය | 8 | 7 | |
| සෙනරත්වෙල මහා විද්‍යාලය | 9 | 4 | |
| මාබේරියතැන්න දෙමළ මහා විද්‍යාලය | 10 | 14 | |

මූලාශ්‍රය: තෙල්දෙණිය අධ්‍යාපන කලාප දත්ත : 2023

සංඛ්‍යා දත්ත අනුව රංගල දෙමළ මහා විද්‍යාලයේ සිසුන් විශාල ප්‍රමානයක් පාසල් හැර ගොස් තිබෙන බව දක්නට ලැබේ. එම පාසලෙහි කලා සහ වාණිජ විෂය ධාරාවන් ක්‍රියාත්මක වන අතර එම විෂය ධාරා දෙකෙහිම ළමුන් 35 දෙනෙකු පාසල් හැර ගොස් තිබෙන බව දක්නට ලැබේ. එමෙන්ම එම පාසලෙහි වැඩි සංඛ්‍යාවක් කලා විෂය ධාරාව හදාරන සිසුන් පාසල් හැර ගොස් තිබේ. එය වඩාත් පැහැදිලිව පහත ප්‍රස්තාර අංක 4.3 දෙස අවධානය යොමු කරන විට දක්නට ලැබේ.

**ප්‍රස්තාර අංක 2**

***තෙල්දෙණිය අධ්‍යාපන කලාපය තුළ කලා, වාණිජ සහ විද්‍යා විෂය ධාරාවන්හි පාසල් හැර ගිය සිසුන් සංඛ්‍යාව***




මූලාශ්‍රයः තෙල්දෙණිය අධ්‍යාපන කලාප දත්ත : 2023

**වගු අංක 3**

***තෙල්දෙණිය අධ්‍යාපන කලාපය තුළ විෂය ධාරාවන් අනුව සිසුන් උසස් පෙළ හැර යාමේ ප්‍රතිශතය***

| විෂය ධාරාව | පාසල් හැර යාමේ ප්‍රතිශතය |
|---|---|
| කලා | 56.8% |
| වාණිජ | 40.6% |
| විද්‍යා | 2.6% |

මූලාශ්‍රයः තෙල්දෙණිය අධ්‍යාපන කලාප දත්ත : 2023

ඉහත වගු අංක 4.4 වගුව දෙස බලන විට පැහැදිලි වන්නේ විශාල වශයෙන් උසස් පෙළ හැර ගොස් තිබෙන්නේ, කලා විෂය ධාරාව හදාරන සිසුන් බවයි. මුළු සිසුන් සංඛ්‍යාවෙන් 56.8% ක ප්‍රමාණයක් උසස් පෙළ හැර ගොස් තිබේ. එමෙන්ම වාණිජ විෂය ධාරාව හදාරන සිසුන් 40.6%ක ප්‍රමාණයක් ද, විද්‍යාව විෂය ධාරාව හදාරන සිසුන්ගෙන් 2.6%ක ප්‍රමාණයක් ද, උසස් පෙළ හැර ගොස් ඇති බව පෙනේ. සමස්තයක් ලෙස ගත් කල කලා විෂය ධාරාව හදාරන බොහෝමයක් සිසුන් පාසල් හැර යාමේ වැඩි ප්‍රවණතාවයක් ඇති බව පෙනි යයි. කලා සහ වාණිජ විෂය ධාරාව සෑම පාසලකම තිබෙන විෂය ධාරාවන් ලෙස දැක ගැනීමට හැකි වුවත් විද්‍යා විෂය

ධාරාව ඇත්තේ එක් පාසලක පමණි. ගණිතය විෂය ධාරාව මෙම සෑම ග්‍රාමීය පාසලක පාහේ දක්නට නොලැබෙන බව වගු අංක 4.3 දෙස බලන විට පැහැදිලි වේ. විද්‍යා විෂය ධාරාවද දක්නට ලැබෙන්නේ මෙම ග්‍රාමීය පාසල් අතුරින් එක් පාසලක පමනි.

***ආර්ථික සාධක***

ග්‍රාමීය පාසල් සිසුන් උසස් පෙළින් වියුක්ත වීමට බලපෑම් කරන සාධක අතර ආර්ථික සාධකය ඔවුන් උසස් පෙළින් වියුක්ත වීමට බලපෑම් කරන්නා වූ ප්‍රධානතම සාධකය වශයෙන් හඳුනා ගැනීමට ලැබුනි. වත්මන් ශ්‍රී ලංකාව තුළ පැන නැගී තිබෙන ආර්ථික අර්බුධය බොහෝ ළමුන්ගේ ජීවිතයට පෙරටත් වඩා තීරණාත්මක ලෙස බලපෑම් කොට සිසුන් උසස් පෙළින් වියුක්ත විමට තීරණාත්මක ලෙස බලපා තිබේ. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන්නේ නිදහස් අධ්‍යාපනයකි. නමුත් දරුවා උසස් පෙළ පන්තියට ඇතුලත් වූ පසු අමතර පන්තියකට යාම අත්‍යාවශ්‍ය කාරණාවක් බවට පත්ව තිබේ. අමතර පන්ති සඳහා ගෙවීමට තරම් වත්කමක් ද, පාසල් උපකරණ වල අධික මිල ඉහළ යාම නිසාවෙන් එම දෙමාපියන්ට දරුවාව පාසල් යැවීමට උනන්දු කරවීමට නොහැකිව ඇත. කොවිඩ් වසංගතය හේතුවෙන් වසරකට වඩා වැඩි කාලයක් පාසල් වසා තැබීමත්, එමෙන්ම රටෙහි ආර්ථිකය කඩා වැටීමත් නිසාවෙන් ග්‍රාමීය ජනතාව ආර්ථික වශයෙන් විශාල ලෙස පසු බෑමකට ලක් වී තිබේ. ඔවුන්ගේ මූලික අවශ්‍යතාවයක් වන දිනක ආහාර වේල් තුනවත් ලබා ගැනීමේ අපහසු තත්ත්වයකට ඔවුන් පත්ව තිබේ. ග්‍රාමීයව ජීවත් වන බොහෝ දෙනා ගත කරනුයේ සුඛෝපභෝගී ජීවිතයක් නොවේ. ඔවුන් තමාගේ එදිනෙදාට පැන නැගෙන මූලික අවශ්‍යතාවය පමණක් තෘප්ත කර ගැනීමට උනන්දු වේ. ග්‍රාමීයව වෙසෙන බොහෝ සිසුන්ගේ දෙමාපියන් නිසි අධ්‍යාපනයක් නොලද පිරිස් නිසාවෙන් ඔවුනට අධ්‍යාපනයේ වටිනාකමක් හෝ දරුවාව අනිවාර්යෙන් පාසල් යවා ඉගැන්විය යුතුය යන සිතිවිල්ල ඇති වන්නේ ද නැත. දරුවාට ඉගැන්වීමේ අවශ්‍යතාවය දැනුනත් ඔවුන් එදිනෙදා ජීවිතය තුළ මුහුණ දී තිබෙන ආර්ථික දුෂ්කරතාවය මධ්‍යයේ ඔවුන්ට එම කාර්ය භාරය ද ඉටු කර ගැනීමේ හැකියාවක් නොමැත.

ග්‍රාමීයව ජීවත් වන බොහෝ මිනිසුන් ඔවුන් මුහුන දෙන අධික දරිද්‍රතාවය නිසාවෙන් දරුවාගේ පාසල් වියදම් දරා ගැනීමට තිබෙන අපහසුතාවය මූලික කොට ගෙන දරුවාව පාසල් යැවීමට අකමැත්තක් දක්වති. එදිනෙදා මූලික අවශ්‍යතාවයන්වත් තෘප්ත කර ගැනීමට නොහැකි වීම නිසා තමාගේ දරුවාව අධ්‍යාපනයෙන් ඈත් කරවීමට ග්‍රාමීයව වෙසෙන බොහෝමයක් පාසල් සිසුන්ගේ දෙමාපියන්ට සිදුව තිබේ. ග්‍රාමීය නොදියුණු යටිතල පහසුකම් වල බලපෑම නිසාවෙන් ග්‍රාමීයව වෙසෙන බොහෝ ප්‍රජාවන් හට තමාගේ අවශ්‍යතා නිසි පරිදි තෘප්ත කර ගැනීමට නොහැකි වේ. නොදියුණු යටිතල පහසුකම් වල ප්‍රතිඵලය වන්නේ සිසුන්ට අධ්‍යාපනය ලැබීමට ඇති පහසුකම් අඩු වීමයි. මේ තුළින් ග්‍රාමීය ජනයා ගම තුළම තිබෙන්නා වූ වගා කටයුත්තක්, කුලී වැඩක් සිදු කරගෙන සිටීමට පෙළඹීම තුළින් ඔවුන්ගේ ආදායම් තත්ත්වය ද, සුභදායක නොවේ. එමෙන්ම ග්‍රාමීය ප්‍රජාවගේ අධ්‍යාපන තත්ත්වය ද එතරම් උසස් නොවන බැවින් ඔවුන්ට ඉහළ රැකියා අවස්ථාවන් සඳහා ද යොමු වීමට ඉඩ කඩක් නොලැබෙන බව පෙනේ. මෙම හේතුන් ග්‍රාමීය දෙමාපියන් සිසුන්ව පාසල් නොයැවීමට බලපාන බව හඳුනා ගත හැකිය.

***දෙමාපියන්ගේ උනන්දුව නොමැති බව***

ග්‍රාමීය පාසල් සිසුන් උසස් පෙළ හැදෑරීමෙන් වියුක්ත වීමට බලපෑම් කරන ලද සාධක පිලිබඳව විමසා බැලීමේදී ග්‍රාමීය දෙමාපියන්ගේ පවතින නූගත්බාවය ද, මේ සඳහා හේතු වූ බව අනාවරණය කර ගැනීමට හැකි විය. ග්‍රාමීය අඩු පහසුකම් සහිත පුද්ගලයන් එදිනෙදා මූලික අවශ්‍යතාවයන් පිලිබඳව පමනක් අවධානය යොමු කරමින් අධ්‍යාපනයට අඩු ස්ථානයක් ද, මුදල් ඉපයීමට වෙහෙසීම සඳහා ප්‍රමුඛස්ථානයක් ලබා දීම ද, දැක ගැනීමට හැකියාව ලැබුනි. බොහෝ ග්‍රාමීය දෙමාපියන් දරුවාට අධ්‍යාපනය ලබා දීමේ දීර්ඝකාලින වැදගත්කම පිලිබඳව නොදැනුවත්ය. ඔවුන් සෑම විටම ඉගෙනීමෙන් ඵලක් නොමැති බව විශ්වාස කිරීම සුලබව දක්නට ලැබේ.

ග්‍රාමියව ජීවත් වන ජනතාව නිරන්තරයෙන්ම මුදල් ඉපයීම පිලිබඳව පමණක් අවධානය යොමු කිරීම නිසාවෙන් ඔවුනට උසස් අධ්‍යාපනයක් ලබා ඉහළ රැකියාවක් කිරීමේ අදහසක් හෝ ඒ සම්බන්ධයෙන් උනන්දුවක් නොමැත. කුඩා කල සිටම තම නිවස තුළින් සමාජානුයෝජනය වන දරුවා තමාගේ දෙමාපියන්ගේ අදහස්, චර්යාවන් අනුකරණය කරමින් ඔවුන්ගේ මාර්ගයේ ගමන් කිරීම සුලබව දක්නට ලැබේ. දැඩි ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ මුදල් උපයා ගන්නා ග්‍රාමීය ජනයා මුදල් වියදම් කරමින් දරුවාට ඉගැන්වීමට මැලිකමක් දක්වනු ලබයි. දෙමාපියන් වැඩි දුර අධ්‍යාපනය ලද පිරිසක් නම් ඔවුන් ද තම දරුවා අධ්‍යාපනයේ ඉහළටම යැවීම සඳහා ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ හෝ කටයුතු කරනු ඇත. නමුත් ග්‍රාමීයව ජීවත් වන බොහෝ මිනිසුන් ගම තුළම ජීවත් වී එදිනෙදා කුලි වැඩක් කරමින් තම අවශ්‍යතා සපුරා ගැනීමට කටයුතු කරති. ඔවුන්ට උසස් අධ්‍යාපනයක් ලබා ගමෙන් පිට වීමට හෝ උසස් රැකියාවක නිරත වීමට අවශ්‍යතාවයක් නොමැති වන්නේ ස්ථානීය ආලය මෙන්ම ඔවුන්ගේ නිවස තුළින් ලද සමාජානුයෝජනය නිසාවෙනි. සෑම විටම ඉගෙගෙනීමට වඩා මුදල් වලට ප්‍රමුඛතාවය ලබා දී අධ්‍යාපනය පසෙක දැමීම බහුලව මෙම ග්‍රාමීය ප්‍රදේශ තුළ දක්නට ලැබේ.

ග්‍රාමීය බොහෝ දෙමාපියන් අකුරු නොදත් අධ්‍යාපනය නොලද පිරිසක් වන අතර ඔවුන්ට දරුවාගේ ප්‍රගතිය සොයා බැලීමටවත් බොහෝ විට දැනුවත් බාවයක් නොමැත. මේ තුළින් දරුවාට ද අධ්‍යාපන ගැටලු පිළිබඳව නිවසේදී සාකච්ඡා කිරීමට දෙමාපිය සහය නොමැති වීම තුළින් අධ්‍යාපනය ලැබීමේ ආශාව නැති වී යාමේ ඉඩ කඩ පවතියි. බොහෝ දෙමාපියන් තම දරුවාට අධ්‍යාපනය ලැබීමේ වටිනාකම කියා දෙමින් අධ්‍යාපනය ලැබීමේ වාසි, අවාසි ආදිය පිළිබඳව ඔවුන් දැනුවත් කරමින් දරුවාට උසස් අධ්‍යාපනයට යොමු කිරීම සඳහා වයැම් කරති. නමුත් ග්‍රාමිය වශයෙන් ජීවත් වන බොහෝ දෙමාපියන්ට අධ්‍යාපනයේ ඇති වටිනාකම දරුවාට තේරුම් කර දීමට තරම්වත් දැනුවත් බාවයක් නොමැත. ග්‍රාමියව පවතින පරම්පරාගත රැකියාවන් ආරක්ෂා කර ගැනීමේ අරමුණින් ද, ඇතැම් දෙමව්පියන් තම දරුවාට උසස් අධ්‍යාපනයක් ලබා දීම සඳහා උනන්දුවක් නොදක්වන බව දැක ගැනීමට හැකියාව ලැබුනි. මෙහිදි දෙමාපියන්ගේ කර්මාන්ත ආරක්ෂා කිරීමේ වගකීම දරුවනට ලබා දීම හේතුවෙන් ඔවුන් අධ්‍යාපනයෙන් වියුක්ත වේ.

***වසංගත තත්ත්වය හමුවේ දීර්ඝ කාලයක් පාසල් වසා තැබීම නිසා පාසල් යාමට ඇති උනන්දුව නැති වී යාම.***

ගෝලිය කොරෝනා වසංගතයත් සමඟ පෙර පාසල් අධ්‍යාපනයේ සිට විශ්ව විද්‍යාල අධ්‍යාපනය දක්වා පරපුරට එල්ල වී ඇති අභියෝග බොහෝය. ඇතැම් සිසුන් අන්තර්ජාල අධ්‍යාපනයට පිවිසි සිටි නමුත් එම වරප්‍රසාදය සෑම දෙනාට එක සේ භුක්ති විදිය නොහැකි විය. සිසුන් පුද්ගලිකව අන්තර්ජාල මාර්ගගත අධ්‍යාපනයට යොමු වීම කෙරෙහි ඔවුන්ගේ ආර්ථික හා සමාජ මට්ටම ද බලපාන අතර විශේෂයෙන් පාසල් අධ්‍යාපනයේදි ඔන්ලයින් අධ්‍යාපනය යොදා ගැනීම නිසාවෙන් බොහෝ සිසුන් පාසල් හැර යාමද දැක ගැනීමට හැකියාව ලැබුනි. කොරෝනා වසංගතය නිසාවෙන් ශිෂ්‍යයන්ට අඛණ්ඩව පාසල් අධ්‍යාපනය ලැබීමට නොමැති වීම නිසාවෙන් ඔවුන්ට අධ්‍යාපනය ලැබීමේ ආශාව පවා නැති වී ගොස් තිබේ.

කොරෝනා වසංගතය හමුවේ අධ්‍යාපන ආයතන වසා දැමීම නිසාවෙන් බොහෝ සිසුන් ප්‍රමාණයකට දුරස්ථ අධ්‍යාපනයට යොමු වීමට සිදු විය. මේ අනුව සිසුන්ට අධ්‍යාපනය ලබා දීම සඳහා විකල්ප ක්‍රමවේදයක් වශයෙන් "මාර්ගගත අධ්‍යාපනයට" අනුගත වීමට සිදු විය. ශ්‍රී ලංකා අධ්‍යාපන දෙපාර්තමේන්තුව ඊ තක්සලාව හා ගුරු ගෙදර වැනි රූපවාහිනි වැඩසටහන් හරහා සිංහල හා දෙමළ යන මාධ්‍ය දෙකෙන්ම අධ්‍යයන වැඩසටහන් ප්‍රචාරණය කළ අතර ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවද, 5 වසර ශිෂ්‍යත්ව විභාගය, අ:පො:ස සා. පෙළ හා උසස් පෙළ සිසුන් ඉලක්ක කරගනිමින් අධ්‍යාපනික වැඩසටහන් ක්‍රියාත්මක කළ ද, මෙරට පාසල් සිසුන්ගෙන් බොහෝමයකට තම නිවෙස් වල රූපවාහිනි හෝ ගුවන් විදුලි යන්ත්‍ර නොමැති වීමත්, අඩු පරිගණක හා තාක්ෂණික දැනුමත්, පහළ සමාජ ස්තර වල සිටින ලොව පුරා මිලියන ගණනක් දරුවන්ට ඩිජිටල් අධ්‍යාපනය සඳහා පහසුකම් නොමැතිවීමත්, විශේෂයෙන්ම ඔවුන්ගේ දෙමාපියන් බොහෝමයකට ජීවන මාර්ග අහිමි වීමත් තුළ දරුවන්ගේ අධ්‍යාපනය සඳහා වියදම් දැරීම බෙහෙවින් අසීරු වී තිබේ. ඒ අනුව පවුල් සංස්ථාව මුහුන දෙන ආර්ථික හා සමාජ ගැටලු වල බලපෑම මෙන්ම නිවසේ සිට අධ්‍යාපනය ලැබීමේදි දෙමාපිය සහය හා මඟ පෙන්වීමක් නොලැබීම ආදි ගැටලු රාශියක් මත ඇතැම් දරුවන්ට අධ්‍යාපනයෙන් ඉවත්වීමට සිදු වී තිබිනි. අනෙක් අතට දරුවන්ට මෙන්ම ගුරුවරුන්ට ද, මාර්ගගත අධ්‍යාපනය හා සම්බන්ධයෙන් පුහුණුවක් නොමැතිවීම හා ඒ හේතුවෙන්ම ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රමවේදයක් ලෙස එය නීරස වීම, නුපුරුදු හා ආකර්ශනීය නොවීම හේතු කොටගෙන සිසුන් අධ්‍යාපනය කෙරෙහි අභිප්‍රේරණය වීම වෙනුවට ඉන් ඈත් වීම හෝ මඟ හැර යාමත්, ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයේ මූලික අංගයක් වන ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා ඉඩක් නොලැබීම, ආදි ගැටලු රැසක් මතු කර ඇත.

***මුදල් ඉපයීමට ඇති අවශ්‍යතාවය මතු වීම.***

ආදි මානවයා ස්වංපෝෂිත ජීවන රටාවකට හුරු වී සිටි අතර ඔවුන්ට තමාගේ අවශ්‍යතා බොහෝමයක් තමන් විසින්ම සපුරා ගැනීමේ හැකියාව පැවතුනි. නාගරිකරණය, ගෝලියකරණය, කාර්මිකරණය ආදි සමාජ වෙනස්වීම්කාරක හේතුවෙන් තරගකාරී ආර්ථික ක්‍රමයක් නිර්මාණය වූ අතර මිනිසාට මුදල් ඉපයීම තමාගේ අවශ්‍යතාවයන් ඉටු කර ගැනීමට අත්‍යවශ්‍යම දෙයක් බවට පත්ව ඇත. අද වන විට කුඩා දරුවන්ට පවා මුදල් භාවිතා කිරීමේ අවශ්‍යතාවය මතු වී තිබේ. විශේෂයෙන්ම තාක්ෂණයේ දියුණුවත් සමඟම දරුවන්ට විවිධ අවශ්‍යතා මතු වී තිබේ. දෙමාපියන්ට දරුවන්ගේ අමතර අවශ්‍යතා සපුරාලීමට නොහැකි වීම තුළින් ඇතැම් දරුවන් අධ්‍යාපනය ලැබීමට වඩා මුදල් ඉපයීමට ප්‍රමුඛතාවයක් ලබා දී තිබෙනු දක්නට ලැබේ. ඇතැම් විට තම දෙමාපියන්ට තමාගේ අධ්‍යාපනයට මුදල් යෙදවිය නොහැකි අවස්ථා වල ඇතැම් සිසුන් පාසල් අධ්‍යාපනය ලබන අතරතුර තමාගේ අධ්‍යාපනික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මුදල් උපයා ගැනීමක් ද දක්නට ලැබේ. නමුත් ඇතැම් සිසුන් අධ්‍යාපනය පසෙකලා මුදල් ඉපැයීමේ අවශ්‍යතාවය මූලික කොටගෙනම පාසල් හැර යාම දක්නට ලැබේ. මෙහිදි දරුවන් අධ්‍යාපනයේ වටිනාකම තේරුම් නොගැනීම මෙන්ම අඩු වයසින් ශ්‍රමය විකිණීම ආදිය බරපතල තත්ත්වයන් සමාජ ගැටලු බවට පත්ව තිබේ.

ග්‍රාමීයව වෙසෙන බොහෝ සිසුන්ට අධ්‍යාපනයේ වටිනාකමක් හෝ ඉහළට ඉගෙන ගැනීමේ අවශ්‍යතාවයක් නොමැත්තේ ඔවුන් උසස් පෙළ විභාගයට මුහුණ දුන්නත් ඔවුන්ගේ බලාපොරොත්තුව වන්නේ ගමෙහිම රැදී සිට ගමෙහි තිබෙන කුමක් හෝ කුලී වැඩක් සිදු කර ජීවිකාව ගෙන යාම නිසා බැවිනි. මේ නිසාවෙන් ඔවුන්

උසස් පෙළ කිරීමට යොමු නොවී අතර මග අධ්‍යාපනය නවතා රැකියාවක් කිරීමට යොමු වේ. ඇතැම් සිසුන්ට දෙමාපියන් ද රැකියාවක් කිරීමට අනුබල දේ. ශිෂ්‍යයාට අධ්‍යාපනය ලබන කාල සීමාව තුළ වෙනත් අවශ්‍යතා මතු වීම නිසාවෙන් මෙම ගැටලුකාරී තත්ත්වය මතු වී තිබේ. ග්‍රාමීයව වෙසෙන ඇතැම් දෙමව්පියන්ට ද, අධ්‍යාපනයේ වටිනාකමක් නොදැනීම නිසාවෙන් තම දරුවා රැකියාවක නිරත වීම සම්බන්ධව විරුද්ධත්වයක් පල නොකරති. මෙය මහත් සමාජ ඛේදවාචකයකි.

බොහෝ ග්‍රාමීය සිසුන් ආර්ථික දුෂ්කරතා වලින් පෙලෙන නිසාවෙන් ඔවුන්ට අඩු වයසින්ම මුදල් ඉපයීමේ අවශ්‍යතාවය ඇති වේ. අධ්‍යාපනික උපකරණ වලට අමතරව තම දෙමව්පියන්ගෙන් ලබා ගත නොහැකි අමතර තාක්ෂණික උපකරණ ආදි දෑ ලබා ගැනීමට දරුවන් මෙලෙස අධ්‍යාපනය අත හැර රැකියාවන් වල නිරත වනවා මෙන්ම, දෙමව්පියන්ට අධ්‍යාපනයේ වටිනාකම නොතේරීම නිසා ද දරුවා රැකියා වල නිරත කරවීම සිදු කරයි. එමෙන්ම සිසුන්ට අනාගත අපේක්ෂාවන් නොමැතිකම නිසාවෙන් තම පියාගේ රැකියාවේ නිරත වීමට හෝ ගමෙහි තිබෙන වෙනත් කුලී වැඩක නිරත වී කුඩා මුදලක් ඉපයීමට යොමු වී තිබේ. වත්මනෙහි දක්නට ලැබෙනුයේ තරගකාරී සමාජ ක්‍රමයක් වන අතරම සිසුවා ද, එම සමාජ ක්‍රමයට සමගාමීව කටයුතු කිරීමට පෙළඹීම මත සිසුවාට ද, මුදල් අවශ්‍යතාවය ප්‍රබල ලෙස ඉස්මතුව පෙනෙන්නට තිබේ. නව යෞවනයන් අත්හදා බැලීම් සඳහා නිරන්තරයෙන් යොමු වන අතර එහිදී ඒකාකාරී අධ්‍යාපන රටාවෙන් මිදී නව සමාජ අවස්ථාවන් අත්හදා බැලීමට යොමු වේ. මෙහිදී සිසුන්ට මූල්‍යමය අවශ්‍යතාවය මතුවන අතර එම අවශ්‍යතා තම දෙමව්පියන් තුළින් සපුරා ගැනීමට නොහැකි වූ විට ඔවුන් තම අධ්‍යාපනය ඒ සඳහා කැප කිරීමට පසු බට නොවෙති.

***පවුලේ පාසල් යාමට සිටින සහෝදර සහෝදරියන්ගේ ප්‍රමාණය වැඩි වීම***

ග්‍රාමීය පාසල් සිසුන් උසස් පෙළ හැදෑරීමෙන් වියුක්ත වීමට බලපෑම් කරනු ලබන සාධක අතර පවුලෙහි පාසල් යැවීමට සිටින සාමාජිකයන් සංඛ්‍යාව විශාල වීම ද බලපෑම් කර තිබේ. ග්‍රාමීය ප්‍රදේශ වල දරුවන් ආර්ථික ගැටලු සඳහා විශාල වශයෙන් මුහුන දෙන අතර මෙහිදී පවුලක් තුළ පාසල් යැවීම සඳහා සිසුන් 4ක් 5ක් වැනි විශාල සංඛ්‍යාවක් සිටීම තුළින් එම පවුලෙහි ආර්ථික තත්ත්වය තවත් දුෂ්කර වේ. විශේෂයෙන්ම අද පවතින ආර්ථික අර්බුදය හමුවේ පාසල් උපකරණ වල මිල පෙර පැවතියා මෙන් දෙතුන් ගුණයක් වැඩි වීම තුළින් පවුලක සිටින සියලු දරුවන් පාසල් යැවීම තවත් දුෂ්කර වී තිබේ.

**නිගමන**

ලබා ගත් දත්ත වලින් අනාවරණය වූ පරිදි උසස් පෙළ දි පාසල් හැර යන බොහෝ දරුවන්ගේ පවුල් ආර්ථික දුෂ්කරතා වලින් පෙළෙන බවත් එම පවුල් වල යම් යම් විසංවිධානකාරී තත්ත්වයන් තිබෙන බවත් අනාවරණය විය. එනම් පාසල් හැර ගිය බොහෝ සිසුන් සිටින පවුල් වල නිශ්චිත ලෙස හඳුනා ගත හැකි වූ ආදායම් මාර්ගයක් නොතිබුනි.

දරුවන් උසස් පෙළ හැදෑරීමෙන් වියුක්ත වීමට ආර්ථික සාධකය සිදු කරන බලපෑම ඉමහත්ය. ආදායම් තත්ත්වය අඩු පවුල් වල දරුවන් වැඩි ප්‍රමාණයක් පාසල් හැර ගොස් ඇති බව අනාවරණය විය. විශේෂයෙන්ම කොරෝනා වසංගතය තත්ත්වය නිසාවෙන් බොහෝ ග්‍රාමීය සිසුන්ගේ දෙමව්පියන්ට රැකියා අහිමි වීමත්, ග්‍රාමීය ප්‍රදේශ වල කුලී වැඩ නොමැති වීමත් ආදි කාරණා නිසාවෙන් සිසුන්ගේ දෙමාපියන්ට දැඩි ආර්ථික දුෂ්කරතාවයන්ට මුහුන දීමට සිදුව තිබේ.

පාසල් යන බොහෝ දරුවන්ට පාසල් හැර යාමට විවිධ හේතු සාධක බලපා තිබුන ද ඔවුන්ගේ පවුල් පරිසරයේ ස්වභාවය සහ ජීවත් වන ප්‍රදේශයේ ස්වභාවය මත ඔවුන්ට ඉගෙන ගැනීම සඳහා අභිප්‍රේරණයක් ඇති නොවීම ද ප්‍රධාන වශයෙන් උසස් පෙළින් වියුක්ත වීමට බලපෑම් කර ඇති බව හඳුනා ගැනීමට හැකියාව ලැබුනි.

උසස් පෙළින් වියුක්ත වූ බොහෝ සිසුන්ගේ දෙමාපියන්ගේ උගත් බව අඩු වීම ද, දරුවන් පාසල් හැර යාමට බලපෑම් කර තිබේ. දරුවන්ගේ ප්‍රධාන මාර්ගෝපදේශකයන් වන්නේ තම මව සහ පියා වන නිසාවෙන් දෙමව්පියන්ගේ අධ්‍යාපන මට්ටම අඩු වීම නිසාවෙන් ඔවුන්ට දෙමාපියන්ගෙන් නිසි මාර්ගෝපදේශයක් නොලැබීම දරුවන් උසස් පෙළින් වියුක්ත වීමට බලපෑම් කර තිබෙන බව හඳුනා ගැනීමට හැකි විය.

දෙමාපියන් දරුවාව අධ්‍යාපනයට යොමු කරනවාට වඩා තමා කරනු ලබන කර්මාන්තයටම යොමු කරවීමට දැඩි උනන්දුවක් දක්වන බවක් මෙහිදී හඳුනා ගැනීමට හැකියාව ලැබුණි. විශේෂයෙන්ම පෙදරේරු වෘත්තියෙහි යෙදෙන පියවරුන් තමාගේ රැකියාවේ පහසුව සඳහා තම පවුලේ පිරිමි දරුවන්ව සහය සඳහා යොදා ගැනීම දක්නට ලැබුනි. මේ තුළින් පාසල් සිසුන් පාසල් යාමද නවතා දමා එම වෘත්තීන් වල නියැලීම හඳුනා ගැනීමට හැකියාව ලැබුනි. මෙහිදී ග්‍රාමීය ප්‍රදේශ වල සිසුන්ගේ දෙමාපියන් විසින් කරනු ලබන වෘත්තීන්ද පරම්පරාවෙන් පරම්පරාවට සම්ප්‍රේෂණය වීම නිසාවෙන් බොහෝ සිසුන් අධ්‍යාපනය අතරමග නතරකොට එම වෘත්තීන් වල නියැලෙන ආකාරයක් හඳුනා ගැනීමට හැකියාව ලැබුනි.

දරුවන් විවිධ හේතු සාධක මත උසස් පෙළින් වියුක්ත වූවත් ඔවුන්ව නැවත පාසල් යැවීම සඳහා බොහෝ දෙමාපියන් ක්‍රියාමාර්ග ගැනීමට හෝ ඔවුන්ව පාසල් යැවීමට උත්සහා කළ බවක් හඳුනා ගැනීමට නොහැකි විය.

සිසුන් පාසල් නොපැමිණීම නිසාවෙන් මැදදුම්බර අධ්‍යාපන කොට්ඨාසයේ තෙල්දෙණිය අධ්‍යාපන කලාපය තුළ පවතින පාසලක් වන දුනුවිල මහාබෝධි මහා විද්‍යාලයේ උසස් පෙළ පන්ති ඉවත්කර තිබෙන බව හඳුනා ගත හැකි විය.

තෙල්දෙණිය අධ්‍යාපන කලාපයේ පාසල් අතරින් 2019-2023ත් අතර කාලය තුළ වැඩිම පිරිසක් උසස් පෙළින් වියුක්ත වී ඇති පාසල ලෙස රංගල දෙමළ මහා විද්‍යාලය හඳුනා ගැනීමට හැකි විය.

තෙල්දෙණිය අධ්‍යාපන කලාපයේ මැදදුම්බර අධ්‍යාපන කොට්ඨාසයට අයත් පාසල් අතරින් පාසල් වල පවතින ප්‍රධාන විෂය ධාරාවන් වන කලා, වාණිජ හා විද්‍යා විෂය ධාරාවන් අතරින් වැඩිම පිරිසක් වියුක්ත වී ඇත්තේ කලා විෂය ධාරාව හදාරන සිසුන් බව අනාවරණය කර ගැනීමට හැකි විය.

දත්ත වලින් අනාවරණය වූ පරිදි අඛණ්ඩව පාසල් නොපැමිණෙන සිසුන් මෙන්ම කඩින් කඩ පාසල් පැමිණෙන සිසුන් ද හඳුනා ගැනීමට හැකි වූ අතර, ඒ අතරින් කඩින් කඩ පාසල් පැමිණෙන සිසුන්ගෙන් වැඩි පිරිසක් එසේ කඩින් කඩ පාසල් ඒමට බලපාන හේතුව වශයෙන් අනාවරණය වූයේ උපකාරක පන්ති සඳහා සිසුන් සහභාගි වීමයි.

**යෝජනා**

පාසලේ ඉගෙනුම් - ඉගැන්වීමේ ක්‍රියාවාලිය ඇතුලු පාසල් කළමනාකරණය හා අධීක්ෂණ කටයුතු විධිමත් කිරීම. ග්‍රාමීය දරුවන් තුළ නව තාක්ෂණික උපාංග පිළිබඳව දැනුවත්බාවය වැඩි කරනු ලබන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ නව තාක්ෂණය යොදා ගනිමින් සිදු කරනු ලබන සැලසුම් සහගත අතිරේක ඉගැන්වීම් ක්‍රම මගින් සිසු චින්තනය වර්ධනය කරන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීමෙන්, උසස් පෙළ ඉගෙනුම් - ඉගැන්වීම් කටයුතු පිළිබඳව පාර්ශවකරුවන්ගේ විශ්වාසය ගොඩ නැගීම. මේ තුළින් සිසුන්ගේ පාසල් පැමිණීමේ රුචිකත්වය ද වර්ධනය කළ හැකිය.

ශිෂ්‍ය රුචිකත්වය පරිදි විෂයධාරා තෝරා ගැනීමට ඉඩ සැලසීම හා ශිෂ්‍ය විවිධත්වය අගයන යහපත් ගුරු - සිසු අන්තර් සබඳතා ගොඩ නැගෙන ප්‍රිය මානාප පාසල් වාතාවරණයක් බිහි කිරීම. මෙහිදී සිසුන්ට පාසල තුළදී තමාගේ රුචිකත්වයට ගැලපෙන සහ අනාගත රැකියා වෙළඳපොල ඉලක්ක කර ගත් වෘත්තීන්ට අදාලව විෂය දැනුම ලබා දීමට කටයුතු සැලසුම් කළ යුතුය.

මෙහිදී උසස් පෙළ විෂය ධාරවන් වල ලිඛිත විභාගයන් ද සිසුන්ගේ ප්‍රායෝගික දැනුම ඉස්මතු වන ආකාරයෙන් සැලසුම් කළ යුතු අතර, රටේ ආර්ථිකයට ගැලපෙන විවිධ ව්‍යාපාර මෙන්ම රැකියා අවස්ථාවන් සඳහා මඟ සැලසෙන පරිදි ප්‍රායෝගික දැනුම දරුවන්ට ලබා දෙමින් ඒ සඳහා ද ප්‍රායෝගික පරීක්ෂණ සැලසුම් කළ යුතුය. පාසල් අධ්‍යාපනයේ වැදගත්කම පිළිබඳ දැනුවත් කිරීම් සහ අධ්‍යාපනික වැදගත්කම් නිරූපණය කරන්නා වූ ළමා වැඩසටහන්, චිත්‍රපට වැනි මාධ්‍ය තුළින් දැනට පාසල තුළ සිටින දරුවන්ට එහි වැදගත්කම අවබෝධ කර දිය යුතුය.

දැනට පාසල් හැර ගොස් ඇති පාසල් නොයන දරුවන් හඳුනාගෙන ඔවුන් තුළ ප්‍රායෝගිකව ධනාත්මක ආකල්ප, උනන්දුව වර්ධනය කළ හැකි වැඩසටහන් දියත් කළ යුතු වේ.

තෝරාගත් පාසල් කිහිප ප්‍රමාණයක පමණක් ක්‍රියාත්මක වන තාක්ෂණික විෂය ධාරාව ග්‍රාමීය පාසල් තුළට ද, ව්‍යාප්ත කර ග්‍රාමීය සිසුන්ට ප්‍රායෝගිකත්වය තුළින් ඉගෙන ගැනීමට අවස්ථා සලසා දීම.

ග්‍රාමීය පාසල් වල යටිතල පහසුකම් සම්බන්ධයෙන් පවත්නා වූ නිශේධනාත්මක තත්ත්වයන් හඳුනාගෙන ඒවා සඳහා පිළියම් යෙදීම. එනම් ප්‍රායෝගික ක්‍රියාකාරකම් වල යෙදීම සඳහා අවශ්‍ය උපකරණ, ශාලා හෝ වෙනත් පහසුකම් ලබා දීම.

දරුවන් පවුලේ ජීවනෝපාය මාර්ගයේදී ශ්‍රමිකයන් වශයෙන් හවුල් කර ගැනීමේදී පාසල් අධ්‍යාපන කටයුතු වලට බාධාවක් නොවන පරිදි ඔවුන්ව සම්බන්ධ කර ගත යුතු අතර එය ඔවුන්ගේ දෛනික කාර්යන් අතර නියමිත රාජකාරියක් නොවීය, විනෝදාංශයක් ලෙස පවත්වාගෙන යාමට දෙමාපියන් උනන්දු විය යුතු අතර, පාසල් අධ්‍යාපනික කටයුතු වලට මූලිකත්වය දිය යුතු බවට දරුවන් තුළ හැඟීමක් ඇති කිරීමට වැඩිහිටියන් අවදියෙන් සිටිය යුතු වීම.

අඩු ආදායම් ලබන පවුල් වල දරුවන් සඳහා යම් කිසි සහනශීලි සුබසාධන සේවාවක් නිසි පරිදි ක්‍රියාත්මක විය යුතුය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


අතුකෝරාළ, ඩි, (1997). *දිවි පැවැත්ම සඳහා ඉගෙනීම.* ශික්ෂා මන්දිර.

අබේපාල, ආර්. (2015). *අධ්‍යාපනයේ මනෝවිද්‍යාත්මක පදනම.* සාර ප්‍රකාශන.

අධ්‍යාපන අමාත්‍යාංශය. (2016). *අනිවාර්ය අධ්‍යාපන ගැසට් නිවේදනය.* (2016.04.26) දිනැති චක්‍රලේඛ අංක 1963/30.

උයන්ගොඩ, ජේ. (2011). *සමාජීය විද්‍යා පර්යේෂණ යෝජනාවලියක් ලිවීම.* සමාජ විද්‍යාඥයන්ගේ සංගමය.

කරුණාදාස, එම්, (2002). *අධ්‍යාපනික සන්නික සන්නිවේදනය හා තාක්ෂණය.* ගොඩගේ.

කාරියවසම්, එස්. (1999). *ලෝක අධ්‍යාපන ප්‍රවනතා.* කොලඹ 08: මන්දිර ප්‍රකාශන.

කාරියවසම්, යු.ජී.පී. සහ කාරියවසම් එස්., (1964) *අධ්‍යාපනය හා එහි පදනම.* ගාල්ල.

ගමගේ, ජී.එම්.ජී.මී සහ විජේවර්ධන, බී.වී.එන්. (2018). *ග්‍රාමීය ළමයින් අධ්‍යාපනය හැර යාමට බලපාන සාධක.* 684-693. http://dr.lib.sjp.ac.lk/bitstream/handle/12345678/8629

ගලගමගේ, එස්. (2016). *අධ්‍යාපන සමාජ විද්‍යාත්මක පදනම,* කර්තෘ .

ගුණවර්ධන, සී. (1995). *අධ්‍යාපනය හා සමාජ සාධක,* සාර ප්‍රකාශන.

ගුණසේකර, එස්. (2016). *පාසල් ළමයින් දැනගත යුතු නීතිය.* සුනෙර ප්‍රකාශන.

ජයකොඩි, සී, (2005). *බුද්ධ දේශනාවෙන් ඉගැන්වෙන අධ්‍යාපන ක්‍රම ශිල්ප.* තාරක පබ්ලිෂර්ස්.

ජයවර්ධන, එස්. (2020) *වසරකදී ශ්‍රී ලංකාවේ පාසල් හැරයන ළමුන් සංඛ්‍යාව 20,000 දක්වා ඉහල යයි.* https://www.wsws.org/sinhala/2020/2020jan/sled-17j.html

ජයවර්ධන, ඒ, (2015). *ලංකාවේ පැරණි දේශීය අධ්‍යාපනය.* ආරිය ප්‍රකාශකයෝ.

දයාරත්න, පී. බී. (2013). *නොවිධිමත් අධ්‍යාපනය.* ගොඩගේ සහ සහෝදරයෝ

රූබේරු, ආර්, (1971). *ලංකා අධ්‍යාපනයේ බ්‍රිතාන්‍ය යුගය 1796-1947.* සී.ස කොළඹ ඇපෝතිකරීස් සමාගම.

වන්නිආරච්චි, ජේ.වී. (2004). *C.W.W කන්නන්ගර චින්තනය හා අධ්‍යාපන කතා පුවත* සෙනරත් ප්‍රකාශන.

වීරසිංහ, එච්, (1982). *පෙරදිග හා අපරදිග අධ්‍යාපන සංකල්ප*. කැලැසික් ප්‍රින්ටර්ස්ඃ

සේනාධීර, එස්. (2002). *ළමා වර්ධනය සහ සංවර්ධනය*. ගොඩගේ සහ සහෝදරයෝ.

සුභසිංහ, ඩබ්ලිව්. (2016). *සමාජ පර්යේෂණ ක්‍රම*. කර්තෘ ප්‍රකාශන.

David, B. Wilber. (1964). *Sociology of Education*. New York: American Book Company.

Dundar, H., Millot, B., Riboud, M., Shojo, M., Aturupane, H., Goyal, S. & Rajud, D., (2017). *Sri Lanka Education Sector Asessment: Achievements, Challenges, and policy Options.* World Bank. http://doi.10.1596/978-1-4648-1052-7

Farwis, M. (2020). *Analysis Of School Dropout among Secondary Students: Case of Sammanthurai Education Zone*. Journal of Academic Multidisciplinary Research. *4*(12), 79- 85. https://www.research gate.net/publication/347963514

Havighurst, J. Robert Bernice I. Neugarten, (1957), *Society and Education, Allyn and Bacon Inc*. Massachusetts

Latif, F., Choudhary, A.I, & Hammayun, A.A. (2015). *Economic Effects of Student Dropouts: A Comparative Study*.Journal of Globel Economics.3(137). http://dx.doi.org/1472/2375-4389.1000137

Ministry of Education, Sri Lanka (MOE), 2013. *Education First Sri Lanka*, Minstry of Education.

Ministry of Education, *Sri Lanka (MOE), 2018a.School Census Report 2017*, Minstry of Education,

Mughal, A.W., Aldridge. J. & Monaghan, M. (2019). Perspectives of Dropped-Out Children on Their Dropping out From Public Secondary Schools in Rural Pakistan. International Journal of Education Development. 52-61. https://doi.org/10.1616/j.ijdudev.2019.02.004

Plowden Report. (1967). *Grade Britain Children Their Primary Schools*. Department of Education and Science, Central Advisory Council for Educational Research and Surveys, London.